# පුංචි දියකිඳුරිය



නිහාරා වෙදගෙදර

# පුංචි දියකිඳුරිය

හැඳින්වීම.

හොඳ මිතුරන් හා දෙමාපිය ඔවදන්
සැමදා සම්පතකි. මේ එයින් අපට
උදාවන යහපත පිළිබඳව මාගේ
ආදරණීය මිතුරු මිතුරියන් හට පෙන්වා
දීමට මා ගත් නිර්මාණශීලි උත්සාහයකි.

නිහාරා යශශ්‍රී වෙදගෙදර

ප්‍රථම මුද්‍රණය - 2023

කතාව සහ චිත්‍ර - නිහාරා යශශ්‍රී වෙදගෙදර

කතෘගේ ලිපිනය - අංකඃ 51/1,
උඩුවෙල පාර,
අම්පිටිය, මහනුවර.

මෙම කතාවේ හා චිත්‍ර වල සම්පූර්ණ අයිතිය කතෘ සතු වන අතර මෙයින් දෙබස් කථා හෝ චිත්‍ර කතෘ අවසරයකින් තොරව උපුටා ගැනීම සම්පූර්ණයෙන් තහනම් වේ.

c නිහාරා යශශ්‍රී වෙදගෙදර

පරිගණක අක්ෂර හා පිටු සැකසුම : චම්පා ස්ටෝර්ස්
අංකඃ 51,
කොටුගොඩැල්ල වීදිය,
මහනුවර.

## පිදුම

ආදරණීය අම්මාටත්, අප්පච්චීටත් මේ
පොත පුදමි.

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයේ එලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවයන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාවයි එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැලපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරි කොට ගෙන ග්‍රන්ථකරණයට යොමු කිරිමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂී ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවන්ට ගැළපෙන ලෙස නවීකරණය කරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සලකා අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතියට එක් වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුන අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කලමණාකරන මණ්ඩලය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන්, සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන්, ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමගින් පිරිනමමි.

මෙම ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත් කරමින් එයට පිවයක් වූ සෙනෙව්රත්න මහලේකම් ගේ සේවය ද අගයමි.

ශෂිකලා සේනාධීර
විදුහල්පතිනිය
මහාමායා බාලිකා විද්‍යාලය-මහනුවර.
2023.10.20

එක ලස්සන දවසක නිල් පාට රැළි නැගෙන මුහුදක පුංචි දියකිඳුරියක් එයාගේ සුරතල් තල්මස් යහළුවා සමඟ බොහෝම සතුටින් සෙල්ලම් කළා.



ඇය කොතරම් සතුටින් සෙල්ලම් කළේ ද යත්, ඇයට නොදැනීම අඳුරු  වැටෙමින් තිබුණා. එක්වරම ඇයගේ සුරතල් තල්මස් යහළුවා  ඇයට මෙහෙම කීවා.

"අනේ දැන් හොඳටම කළුවර වැටිලානේ....." දැන් අපි කොහොමද ගෙදර යන්නේ ? කලබල වී වටපිට බැලු ඇයට පෙනුනේ හොඳටම රැ බෝ වී ඇති බවයි.


ආපසු යෑමට සැරසුනත් පාර සොයා ගත නොහැකි තරමටම කළුවර වැටී තිබුණා.

දෙදෙනා හොඳටම බය වුණා. දෑස් වලින් කඳුළු කැට කඩා වැටුණා. රාත්‍රිය වන විට මහ මුහුදේ සිදුවන අරුම පුදුම දේවල් ගැන ඔවුන් හොඳින්ම දැන සිටියා.

“රෑට සමහර අදුරු තැන් වල භයානක මාළුවන් සිටිනවා. ඔවුන් අපිව කා දමා වී.”පුංචි දියකිඳුරිය කීවා.

“ඇයි ! විශාල දියවැලකට වුණත් හසුවී අප ගසාගෙන යන්නත් පුළුවන්” තල්මස් යහළුවා කීවා.





එක් වරම ඔවුන් අසළින් මතු වූ විශාල මැළුවෙකු දුටු ඔවුන් හොඳටම බය වුණා. මහා හයියෙන් කෑ ගැසුවා.

“බය වෙන්න එපා දරුවනේ මේ මම “අම්මා”” තල්මස් පැටවාගේ අම්මා කිවුවා.

මේ තරම් රෑ වෙනතෙක් ඔබ මොකද කළේ?

මේ විශාල සාගරය මහා හයානක තැනක්. තල්මස් අම්මා කිවුවා. අපි දැන් ගෙදර යමු.

“අනේ අම්මේ මගේ යාළුවා දාලා යන්න බෑ ! අපි ඇයට ගෙදර යන්න උදවු කරමු.”

“හා හොඳයි, එහෙනම් නගින්න මගෙ පිට උඩට ” තල්මස් අම්මා කියුවා. ඉන් පසු ඔවුන් සියළුදෙනාම පුංචි දියකිඳුරියගේ  නිවස සොයන්න පිටත් වුණා.



ගැඹුරු මුහුදින් එහා ලස්සන කොරල්පර වට වූ ඇගේ නිවස ඔවුන්ට සොයාගත හැකි වුණා. පුංචි දියකිඳුරියගේ දෙමවුපියන් ඇය එනතුරු බලා සිටියා.

"ඇය දැකීමෙන් ඔවුන් සතුටට පත් වුණා." තල්මස් අම්මාටත් ස්තූති කළා ! ඉතිං ඔවුන් සියළුදෙනාම සතුටු වුණා.

නැවත එවැනි නොසැලකිලිමත් දේවල් නොකරන්න ඔවුන් පොරොන්දු වුණා.



ස්තූතියි

මාගේ  නිර්මාණය සඳහා නන් අයුරින්
සහයෝගය දුන් මාගේ දෙමාපියන්ටත්,
වැරදි නිවැරදි කොට මඟ පෙන්වූ,
පන්තිභාර නිල්මිණී වික්‍රමතිලක ගුරු
මෑණියන්ටත්, මෙම සංකල්පය තුලින්
නව මාවතකට විවර කර දුන් ප්‍රාථමික හා
ද්විතීයක  අංශභාර විදුහල්පතිනියන්
දෙපලටත් මාගේ හදපිරි ස්තූතිය පුද
කරමි.



නිහාරා යශශ්‍රී වෙදගෙදර
3 ශ්‍රේණිය A
මහාමායා බාලිකා විද්‍යාලය,
මහනුවර

## පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්ථනයන් හේතු කොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීපකරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාන හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝදයක් ඇති කිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියා මූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්ථාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන්ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛණ සංස්කෘතිය නව මාවතකට යොමු කරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යාන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුනු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ  මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතරම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මඟපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට  ආලෝකයක් සපයයි පාසල් මට්ටමින් ආරම්භකර ජාතක තලය දක්වා විවිධ අභියෝග මැද සංකල්ප මංකොල්ලයන්ට හසුවෙමින් පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වුයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

"දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමඟ එක්ව විද්‍යුත් කෘතියක් රචනා කර ජනගත කරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු.

සෙනෙවිරත්න මහලේකම්
පාසල් දරුවන් ග්‍රන්ථකරණයට
යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාතෘ
2023.10.20

ISBN 978-624-206-745-2